# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2263/23 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

8(9) උපවගන්තිය යටතේ නිවේදනය

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8 (9) උපවගන්තියේ දක්වා ඇති විධිවිධාන අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගනු ලැබීම සඳහා නිකුත් කරනු ලබන විධාන පහත උපලේඛනයේ දැක්වෙන පරිදි නිවේදනය කරමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 21 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.


1A - G 35865 — 60 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උපවගන්තිය යටතේ දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගැනීමට අදාලව එකී පනතේ 7 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් එම පනතේ 8(9) උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධාන

| ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව ඉදිරිපත් කළ යුතු ලේඛන | | නිර්ණායක |
|---|---|---|
| 1. පක්ෂ ව්‍යවස්ථාව | 1.1. | දේශපාලන අරමුණු පාදක වී තිබිය යුතුය. |
| | 1.2. | සාමාජිකයන් සහ නිලධාරි මණ්ඩලය පත්කිරීම, ඉවත්කිරීම හා විනය කටයුතු සම්බන්ධව ස්වභාවික යුක්ති මූලධර්ම හා ප්‍රජාතන්ත්‍රවාදය සුරකෙන ප්‍රතිපාදන ඇතුළත්ව තිබිය යුතුය. |
| | 1.3. | දේශපාලන පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රමවේදය පැහැදිලිව දක්වා තිබිය යුතුය. |
| | 1.4. | මහ සභා රැස්වීම්, විශේෂ මහ සභා රැස්වීම් හා කාරක සභා රැස්වීම් කැඳවීමේ කාල වකවානු පිළිබඳව ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් කර තිබිය යුතුය. |
| | 1.5. | ජාති, ආගම්, භාෂා, කුල ගෝත්‍ර යනා දී වශයෙන් සමාජමය බෙදීම් ඇති කිරීමට පදනම් විය හැකි වගන්ති හෝ විධිවිධාන පක්ෂ ව්‍යවස්ථාව තුළ ඇතුළත් නොවිය යුතුය. |
| 2. නිලධාරි මණ්ඩලය | 2.1. | දේශපාලන පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් වන ප්‍රධාන තනතුරක් සඳහා කාන්තා නියෝජනය සහතික විය යුතුය. |
| | 2.2. | දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්ව වර්ෂ 4ක කාලයක් තුළ නිලධාරි මණ්ඩල තුළ කාන්තා නියෝජනය තහවුරු වී තිබිය යුතුය. |
| | 2.3 | පක්ෂ නිලධාරි මණ්ඩලය තුළ සන්ධානගත නොවී වෙනත් පක්ෂ නියෝජනය කරන නිලධාරීන්/සාමාජිකයන් සිටී නම් ඔවුන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතුය. |
| 3. විගණනය කරන ලද ගිණුම් වාර්තා | 3.1. | පක්ෂ ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්ව වසර 4ක කාලය සඳහා විගණනය කරන ලද විගණන මතය සඳහන් ගිණුම් වාර්තා ලබා දී තිබිය යුතුය. |
| | 3.2. | ඉහත 3.1 හි ඉදිරිපත් කරනු ලබන ගිණුම් වාර්තා ලියාපදිංචි විගණකවරයෙකු විසින් විගණනය කර තිබිය යුතුය. |
| 4. පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය | 4.1. | දේශපාලන පක්ෂ ව්‍යවස්ථාවේ දක්වා ඇති අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් වූ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වීම අත්‍යවශ්‍ය වේ. |
| | 4.2. | ප්‍රතිපත්ති ප්‍රකාශය පක්ෂයේ මධ්‍යම කාරක සභාව/නිලධාරි මණ්ඩලය විසින් සරල බහුතරයෙන් අනුමත කර තිබිය යුතුය. |
| 5. දේශපාලන ක්‍රියාකාරකම්: | 5.1. | මූලික වශයෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඡන්ද බලය, නීතියේ ආධිපත්‍ය සුරැකීම හා මහජනයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සක්‍රීයව දායක වූ ක්‍රියාකාරකම් ඉටුකොට තිබිය යුතුය. |

5.2. දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පෙර අවම වශයෙන් වර්ෂ 4ක කාලයක් තුළ දේශපාලන ක්‍රියාකාරකම්වල නිරතව තිබිය යුතුය. එම වර්ෂ 4 තුළ දී එක් එක් වර්ෂයක දී දේශපාලන ක්‍රියාකාරකම් 5ක් බැගින්වත් ඉටු කොට තිබිය යුතු අතර, එකී එක් එක් දේශපාලන ක්‍රියාකාරකම් පහ අතරින් අවම වශයෙන් දෙකක් හෝ <u>ප්‍රමුඛ දේශපාලන කාර්යයන් විය යුතුය.</u>

**5.2.2 ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකම්:**

i. දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂය සිවු වසරක කාල සීමාව තුළ ස්වාධීනව හෝ වෙනත් පිළිගත් දේශපාලන පක්ෂයක් සමග අවබෝධතා ගිවිසුමක් මගින් සන්ධානගතව සිය අපේක්ෂකයන් ඉදිරිපත් කර හෝ යම් වර්ෂයක කුමන හෝ මැතිවරණයක් සඳහා ස්වාධීනව තරගකර තිබිය යුතුය.

ඡන්ද විමසීම් කාලය අනුයාත වර්ෂ දෙකකට ඇතුළත්වන විට එම ඡන්ද විමසීමට තරග කිරීමේ කාර්යය වර්ෂ දෙක සඳහාම සැලකිල්ලට ගනු ලැබේ. එසේ වුව ද වර්ෂ දෙකක සලකා බැලිය හැක්කේ තනිව හෝ සන්ධානගතව තරගකර ඇති බව නිශ්චිතව සනාථ වන්නේ නම් පමණි.

ii. යම් දේශපාලන පක්ෂයක් යම් වර්ෂයක එහි වාර්ෂික සම්මේලනය හා දිස්ත්‍රික් සම්මේලන පැවැත්වීම්, ශාඛා සමිති පිහිටුවීම් සිදුකර ඇත්නම් හා ඒ බව සනාථ වේ නම් අදාළ වර්ෂය තුළ ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

iii. දේශපාලන ක්‍රියාකාරකම් සිදුකරන යම් පක්ෂයක්, ස්වකීය පක්ෂයේ ප්‍රතිපත්ති හා දේශපාලනමය ක්‍රියාකාරකම් ප්‍රචාරය සඳහා පසුගිය සිවු වසරක කාලය තුළ අඛණ්ඩව, පුවත්පත් හෝ සඟරා මුද්‍රණය කර තිබීම ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

iv. යම් ජාතික හෝ සමාජ ප්‍රශ්නයක් පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට පිළිගත හැකි ජාතික වශයෙන් විවිධ ක්‍රියාකාරකම්වල අදාළ වසර පුරා යෙදී තිබිය යුතුය.

v. ජාතික වශයෙන් දිවයින පුරා අදාළ දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශ, මූලධර්ම හා අදහස් ජනගත කිරීම සඳහා අඛණ්ඩ වැඩපිළිවෙලක් අදාළ වසර පුරා ක්‍රියාත්මක කර තිබීම ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

**5.2.3. වෙනත් දේශපාලන ක්‍රියාකාරකම්:**

i. රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ පක්ෂ හෝ විපක්ෂ ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව මැදිහත්වී තිබීම වෙනත් දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

ii. මහජන අයිතිවාසිකම් වෙනුවෙන් සක්‍රීයව පෙනී සිටීම සඳහා වූ ක්‍රියාකාරකම් වෙනත් දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

iii. රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඡන්ද බලය, නීතියේ ආධිපත්‍ය සුරැකීම සඳහා හෝ කරනු ලබන විවිධ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම හෝ එයට අදාළ වෙනත් ක්‍රියාකාරකම් වෙනත් දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

iv. රටේ පාලන බලය ලබාගැනීමට අදාළව පක්ෂ ක්‍රියාකාරීන් හා ජනතාව දැනුවත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම වෙනත් දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ.

v. යම් ඡන්ද විමසීමක දී ජයග්‍රහණය කර ඇති අපේක්ෂකයන් එම පක්ෂය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ මහජන නියෝජිතායතනය තුළ ක්‍රියාකිරීමද ඒ ඒ වර්ෂයට අදාළ පක්ෂයේ වෙනත් දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබේ.

vi. යම් සංවිධානයක් ඒ හා බැඳි අනුබද්ධ වෘත්තීය, තරුණ, කාන්තා යනා දී සංවිධාන අඛණ්ඩව පවත්වාගෙන යමින් කටයුතු කරන්නේ නම් හා එම සංවිධාන, අදාළ දේශපාලන පක්ෂය විසින් මෙහෙයවන බව සනාථ වේ නම් එකී කාර්යයන් එම පක්ෂයට අදාළ වෙනත් දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබේ.

vii. පක්ෂයේ නමින් ඇති සමාජ ජාල පෞද්ගලික ගිණුම් හෝ සීමිත සමූහ හරහා පක්ෂයේ මතවාද ප්‍රචාරය කිරීම ඒ ඒ වර්ෂයට අදාළව දේශපාලනමය කාර්යයන් වන නමුදු ප්‍රමුඛ දේශපාලනමය ලෙස කාර්යයක් නොසැලකේ. පක්ෂයේ ක්‍රියාකාරීන්ගේ පෞද්ගලික නමින් පවත්වාගෙන යන සමාජ ජාල ගිණුම්වල සඳහන් කරුණු පක්ෂයේ ක්‍රියාකාකරකම් පිළිබඳ සාක්ෂි ලෙස ලබා ගත හැකි නමුත්, එම පෞද්ගලික නමින් වන ගිණුම් පවත්වාගෙන යාම පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සැලකිය නොහැක.

viii. පක්ෂයේ යම් නිශ්චිත නායකයකු හෝ නිලධරයකු විසින් පක්ෂයේ නමින් විවිධ කරුණු සඳහා නිතිපතා මුද්‍රිත/විද්‍යුත් මාධ්‍ය හෝ සමාජ ජාල මගින් නිවේදන නිකුත් කිරීම හෝ මාධ්‍ය සාකච්ඡා නිරතුරුව පැවැත්වීම හෝ ඒ ඒ වර්ෂය සඳහා පක්ෂයේ එක් ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකි නමුත් මහජන සහභාගීත්වයකින් තොරව නැතහොත් භූමියේ කිසිදු ක්‍රියාකාරීත්වයක් නොමැතිව මාධ්‍ය නිවේදන නිකුත් කිරීම හෝ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම හෝ පමණක් සිදුකිරීම අඛණ්ඩ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකනු නොලැබේ.

ix. ජාතික හෝ අන්තර් ජාතික වැදගත්කමකින් යුතු කරුණු සම්බන්ධයෙන් නිසි බලධාරීන් වෙත ලිඛිතව කරුණු දැක්වීම පමණක් පක්ෂ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස නොසැලකේ. එසේ වුව ද එවැනි විවිධ කරුණුවල දී මෙවැනි ලිපි භාරදීම නිරතුරුව සිදුකිරීම ඒ ඒ වර්ෂය තුළ මාධ්‍ය නිවේදන නිකුත්කිරීම් සේ සලකා ක්‍රියාකරනු ලැබේ.

x. වෙනත් දේශපාලන පක්ෂවල සංවත්සර උත්සව හා වාර්ෂික සම්මේලන සඳහා ආරාධනා ලැබීම හෝ සහභාගීවීම, රාජ්‍ය උත්සව හෝ රජයේ රැස්වීම්වලට හෝ සහභාගිවීම පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස නොසැලකේ.

xi. හුදෙක්ම පාරිසරික, ආගමික, සුභසාධක, සමාජසේවා, වෘත්තීය සමිති වැනි එක් ක්ෂේත්‍රයක් සඳහා පමණක්ම සංවිධානගත වූ සංවිධානවල එම විෂයට අදාළ ක්‍රියාකාරකම් පමණක් සිදුකිරීම අඛණ්ඩ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සැලකිය නොහැකිය. යම් සංවිධානයක් එක් වර්ෂයක දී පාරිසරික හෝ සමාජ සුභසාධක හෝ සමාජ සේවා හෝ වෘත්තීමය හෝ ක්‍රියාකාරකම් කිහිපයක් හා වෙනත් දේශපාලන ක්‍රියාකාරකම් ද සිදුකර ඇත්නම් වර්ෂය තුළ කරන ලද එකී පාරිසරික ක්‍රියාකාරකම් හෝ සුභසාධක ක්‍රියාකාරකම් හෝ සමාජ සේවා ක්‍රියාකාරකම් හෝ වෘත්තීමය ක්‍රියාකාරකම් ඒ වර්ෂයට අදාළව එකක් දේශපාලනමය ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකිය. තව ද සෙසු දේශපාලන ක්‍රියාකාරකම් සමග මෙවැනි ක්ෂේත්‍ර කිහිපයක ක්‍රියාකාරකම් සිදුකර ඇති විට දී ඒ ඒ ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම් ඒකාබද්ධ කොට ඒ ඒ ක්ෂේත්‍රය සඳහා වූ වෙන් වෙන් ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබේ.

xii. යම් සංවිධානයක් දේශපාලන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස සමාජ සේවා කටයුතුවල හෝ සමාජ සුභසාධන ක්‍රියාකාරකම්වල හෝ පරිසර සුරැකීමේ කාර්යයන්හි නියැලීම ඉදිරිපත් කරන්නේ නම් එවැනි ක්‍රියාකාරකම් මුලු දිවයිනම ආවරණය වන පරිදි සිදුකර නොමැත්තේ

නම් අවම වශයෙන් සම්පූර්ණ මැතිවරණ කොට්ඨාසයක් නැතහොත් පරිපාලන දිස්ත්‍රික්කයක්ම සම්පූර්ණයෙන් ආවරණයවන පරිදි එම කටයුතුවල යෙදී ඇත්නම් පමණක් එකී ක්‍රියාකාරකම් දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකා බැලීමේ හැකියාව ඇත, උදාහරණයක් වශයෙන් එක් මැතිවරණ කොට්ඨාසයක ගම් කිහිපයක් සඳහා පමණක් සමාජ සේවා කටයුතුවල යෙදීම දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සැලකිය නොහැකිය.

| | | |
|---|---|---|
| 6. ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන | 6.1 | මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටින අවස්ථාවක දී ඉහත සියලුම ක්‍රියාකාරකම් සනාථ කිරීම සඳහා විධිමත් ලියකියවිලි/ වාර්තා ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. |

EOG 01-0208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.